දැන්වීමයි.

රාජ්‍ය සේවා කොමිෂන් සභාව

රේගු අධිකාරී තනතුරෙහි පුරප්පාඩු පිරවීම

රේගු අධිකාරී තනතුරෙහි 2019.01.02 දින සිට 2019.12.31 දින දක්වා ඇති වූ පුරප්පාඩු 36 ක් පිරවීම සඳහා නියෝජ්‍ය රේගු අධිකාරීවරුන් ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**1. බඳවා ගැනීමේ ක්‍රමය**

නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් අතුරින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත්කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත ජ්‍යෙෂ්ඨතාවය මත පමණක් පුරප්පාඩු සංඛ්‍යාව අනුව බඳවා ගනු ලැබේ.

**2. අවශ්‍ය සුදුසුකම් :**

2:1 වෘත්තීය සුදුසුකම්:

(i) නියෝජ්‍ය රේගු අධිකාරී තනතුරෙහි ස්ථිර පත්වීමක් ලබා තිබීම.

(ii) අයදුම්පත් කැඳවන අවසාන දිනට පූර්වාසන්න වූ වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා විනයානුකූල දඬුවමකට ලක් නොවී තිබීම.

(iii) අනුමත කාර්ය සාධන ඇගයීම් පටිපාටිය අනුව අයදුම්පත් කැඳවන අවසාන දිනට පූර්වාසන්න වූ වසර පහ (05) ක කාලය තුළ සාමාන්‍ය මට්ටමේ හෝ ඉන් ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

සටහන :

''කෙසේවතුදු රේගු අධිකාරී තනතුරෙහි පුරප්පාඩුවක් පවතිද්දී ඉහත (i) හි දැක්වෙන පූර්ව අවශ්‍යතාවයන් සපුරා ඇති නිලධාරීන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් නොමැති විටක එම පුරප්පාඩු පිරවීමට වෙනත් විකල්පයක් නොමැති බව සලකා සහකාර රේගු අධිකාරී I හා II ශ්‍රේණිවල සතුටුදායක සේවා කාලය ගණන් බලා ජ්‍යෙෂ්ඨතම නිලධාරීන් අනෙකුත් පූර්ව අවශ්‍යතා සපුරා තිබීමට යටත්ව, රේගු අධිකාරී තනතුරට පත්කිරීමට සුදුසුකම් ලබයි.''

**3. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි හා සේවා කොන්දේසි :**

(i) මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතුය.

(ii) මෙම පත්වීම එක් අවුරුදු වැඩබැලීමේ කාලයකට යටත්ය.

(iii) මෙම පත්වීම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති, මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහයේ විධිවිධාන, දෙපාර්තමේන්තු නියෝග, රජය මඟින් නිකුත් කර ඇති හා නිකුත් කරනු ලබන නියෝගවලට යටත්වේ.

(iv) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 හි සඳහන් විධිවිධාන හා ඊට අනුශාංගික චක්‍රලේඛවල විධිවිධාන අනුව රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබා ගත යුතුය.

**4. වැටුප් පරිමාණය**

මෙම තනතුරට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 දරන වැටුප් චක්‍රලේඛයට අනුව SL-1-2016 රු.47,615–10x1,335-8x1,630-17x2,170-රු.110,895/- ක (මාසික) වැටුප් පරිමාණයක් හිමිවේ. (ඔබට වැටුප් ගෙවනු ලබන්නේ එම චක්‍ර ලේඛයේ විධිවිධානවලට අනුව එහි උපලේඛන II හි සඳහන් පරිදි වේ.)

**5. අපේක්ෂකයින්ගේ අනන්‍යතාවය**

සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන්නේ සෑම ආකාරයකින්ම සම්පූර්ණ අයදුම්පත් ඉදිරිපත් කර ඇති අපේක්ෂකයින් පමණි.

සම්මුඛ පරීක්ෂණයේදී තමන්ගේ අනන්‍යතාවය සහතික කිරීම සඳහා පහත සඳහන් අනන්‍යතා පත්‍ර පිළිගනු ලැබේ.

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද වලංගු ජාතික හැඳුනුම්පත
(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

**6. අයදුම්පත් ඉදිරිපත් කළයුතු ආකාරය**

(i) අයදුම්පත් ..2020.07.31.. දිනට හෝ එදිනට ප්‍රථම රේගු අධ්‍යක්ෂ ජනරාල් වෙත ලැබෙන සේ ඉදිරිපත් කළ යුතු වේ. නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(ii) ඉදිරිපත් කළයුතු අයදුම්පත්‍රයේ ආදර්ශ ආකෘතියක් මෙම නිවේදනය අවසානයේ දැක්වේ. අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත් A4 ප්‍රමාණයේ කඩදාසියක පිළියෙල කර ඉදිරිපත් කළ යුතුවේ.

(iii) නිලධාරීන් තම අයදුම්පත් තමන් සේවය කරන අංශයේ අධ්‍යක්ෂ මඟින් ඉදිරිපත් කළ යුතුය.

(iv) මේ සමඟ ඇති ආදර්ශ අයදුම්පත්‍රයේ ආකෘතියට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් නැතිවීම හෝ ප්‍රමාද වීම ගැන කිසිදු පැමිණිල්ලක් භාර ගනු නොලැබේ.

7. සාවද්‍ය තොරතුරු සැපයීම

ඔබ විසින් එවන ලද අයදුම්පත්‍රයේ සඳහන් කර ඇත්තාවූ යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් ඔබගේ අපේක්ෂත්වය අවලංගු කරනු ලැබේ. එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදාල ක්‍රියා මාර්ගයන්ට යටත්ව සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

පත්වීම ක්‍රියාත්මක වන දිනය සහ පත් කරනු ලබන සංඛ්‍යාව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ. කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවක් හෝ පුරප්පාඩු සියල්ල පිරවීමට හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාවට බලය ඇත.

මෙම ගැසට් නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් හෝ පරස්පරතාවක් හෝ ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු වන්නේය.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි.

එස්.ආර්.ආටිගල
ලේකම්
මුදල්,ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය
කොළඹ 01
2020. 07. 16

එස්. ආර්. ආටිගල
මහා භාණ්ඩාගාරයේ ලේකම් සහ
මුදල්, ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශයේ ලේ...
මුදල්, ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාං...
මහලේකම් කාර්යාලය
කොළඹ 01

# அறிவித்தல்

## அரச சேவை ஆணைக்குழு

## சுங்க அத்தியட்சகர் பதவியில் காணப்படும் வெற்றிடங்களை நிரப்புதல்

சுங்க அத்தியட்சகர் பதவியில் 2019.01.02 ஆம் திகதி முதல் 2019.12.31 ஆம் திகதி வரையில் காணப்பட்ட 36 வெற்றிடங்களை நிரப்பும் நோக்கில், பிரதி சுங்க அத்தியட்சகர்களிடமிருந்து விண்ணப்பங்கள் கோரப்படுகின்றன.

### 1. ஆட்சேர்ப்பு முறை

அறிவித்தலில் விபரிக்கப்பட்டுள்ள தகைமைகளைப் பூர்த்திசெய்துள்ள விண்ணப்பதாரிகளுக்கு மத்தியில், அரச சேவை ஆணைக்குழுவினால் நியமிக்கப்படுகின்ற நேர்முகப் பரீட்சைக் குழுவொன்றின் மூலம் நடாத்தப்படுகின்ற நேர்முகப் பரீட்சையின் பெறுபேறுகளின் பேரில், சேவைமூப்பு அடிப்டையில் மாத்திரம் வெற்றிடங்களின் எண்ணக்கைக்கு அமைய ஆட்சேர்ப்பு செய்யப்படவுள்ளது.

### 2. தேவையான தகைமைகள்:

**2:1 தொழில்சார தகைமைகள் :**

(i) பிரதி சுங்க அத்தியட்சகர் பதவியில் நிரந்தர நியமனமொன்றைப் பெற்றிருத்தல்.

(ii) விண்ணப்பம் கோரப்படுகின்ற இறுதித் தினத்திற்கு உடன் முன்சென்ற 05 வருட சேவைக் காலத்தினை திருப்திகரமான முறையில் பூர்த்திசெய்திருத்தல் வேண்டுமென்பதோடு ஒழுக்காற்று நடவடிக்கைக்கும் உட்படாதிருத்தல்.

(iii) அங்கீகரிக்கப்பட்ட செயலாற்றுகை மதிப்பீட்டுத் திட்டத்திற்கு அமைவாக, விண்ணப்பம் கோரப்படுகின்ற இறுதித் தினத்திற்கு உடன் முன்சென்ற ஐந்து (05) வருட காலப்பகுதியில் சராசரியான அல்லது அதற்கு மேற்பட்ட செயலாற்றுகை மட்டமொன்றினைக் கொண்டிருத்தல்.

#### குறிப்பு

"இருப்பினும், சுங்க அத்தியட்சகர் பதவியில் வெற்றிடம் காணப்படுகையில், மேலே பந்தி (i) இல் குறிப்பிடப்பட்டுள்ள முன் தேவைப்பாடுகளைப் பூர்த்திசெய்துள்ள அலுவலர்கள் தேவையான எண்ணிக்கையில் இல்லாதவிடத்து, அப்பதவியினை நிரப்புவதற்கான மாற்று நடவடிக்கை என்ற வகையில் உதவி சுங்க அத்தியட்சகர் பதவியில் தரம்-I மற்றும் தரம்-II பதவிகளிலுள்ள அலுவலர்களில், திருப்திகரமான சேவைக் காலத்தினைக் கணக்கிட்டு, ஏனைய முன்நிபந்தனைகளைப் பூர்த்து செய்துள்ள, சிரேஷ்ட நிலையிலுள்ள அலுவலர்களும் சுங்க அத்தியட்சகர் பதவிக்கு நியமிப்பதற்காகத் தகைமையினைப் பெறுகின்றனர்"

### 3. சேவை மற்றும் நியமனம் பற்றிய நிபந்தனைகள்

i. இப்பதவி நிரந்தரமானதும் ஓய்வூதியக் கொடுப்பனவினையும் கொண்டதுமாகும். விதவைகள் மற்றும் அநாதைகள் ஓய்வூதியத் திட்டத்திற்கு/தபுதாரர் மற்றும் அநாதைகள் ஓய்வூதியத் திட்டத்திற்கும் பங்களிப்புச்செய்தல் வேண்டும்.

ii. நியமனமானது ஒரு வருட தகுதிகாண் காலத்தைக் கொண்டிருக்கும்.